# කෘෂිකර්ම අමාත්‍යාංශය

# ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB)

NLDB

## තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුර පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### තනතුර - සාමාන්‍යාධිකාරී HM 2-1-2016

**තනතුර සඳහා පැවරෙන කාර්යයන්හි ස්වභාවය**

සාමාන්‍යාධිකාරී, NLDB ආයතනයේ ඉහලම තලයේ විධායක නිලධාරියා වේ. ඔහු NLDB ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සහ පරිපාලනමය හා මූල්‍ය කටයුතු සම්බන්ධව වගකීම හා නෛතික බැඳීම් දරනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ පොදු දිශානතිය හා පාලනය යටතේ, මණ්ඩලයේ බලතල, ක්‍රියාකාරකම් හා රාජකාරී ද්‍රියාවන්මත කිරීම හා ඉටුකිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දෙනු ලබන රපිදි සිදු කිරීම සහ නායකත්වය ලබාදෙමින්, නිල ජයග්‍රහණ ලද අවස්ථාවන්හිදී මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ධෛර්යමත් කිරීම සිදු කළ යුතුය.

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලන / වතු කළමනාකරණ / පශු වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

සහ

විද්‍යා / කෘෂිකර්ම / පශු වෛද්‍ය විද්‍යා / ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ පිළිගත් කළමනාකරණ වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තාලයේ වසර පහක් (05) ඇතුලත්ව අවම වසර 20 ක කළමනාකරණ තලයේ පළපුරුද්ද සමග ප්‍රථම උපාධිය ලබාගත් පසුව, සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක සනාථ කල සේවා වාර්තාවක්,

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගිත් විද්‍යා / කෘෂිකර්ම / පශු වෛද්‍ය විද්‍යා / ව්‍යාපාර පරිපාලන / වතු කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

සහ

විද්‍යා / කෘෂිකර්ම / පශු වෛද්‍ය විද්‍යා / ව්‍යාපාර පරිපාලන හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක PHD උපාධියක්,

සහ

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද සමග, සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, ප්‍රථම උපාධිය ලබාගත් හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, ප්‍රථම උපාධිය ලබාගත් පසුව, සනාථ කළ සේවා වාර්තාවක් සහ කළමනාකරණ පළපුරුද්ද,

සහ

බහු විෂය ක්ෂේත්‍ර කණ්ඩායම් වලට නායකත්වය ලබාදීමේ හා මෙහෙයවීමේ සනාථකල හැකියාව සහ මණ්ඩලයේ සියලු මානව හා වෙනත් සම්පත් නිසි පරිදි සේවයේ යෙදවීම හා කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධව පළපුරුද්ද

**වයස** : අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : HM 2-1-2016 රුපියල් 91.645/- - 12 x 2,700 - රුපියල් 124,045/-

එයට අමතරව, රජය සතු ව්‍යවසායික ආයතන සඳහා අදාල වන අනුමත කළ දීමනාද ගෙවනු ලැබේ.

***අමතර ප්‍රතිලාභ :***

- ➢ කම්කරු දීමනා දෙකක් සහිතව පූර්ණ ගෘහ භාණ්ඩ සහිත බංගලාවක්
- ➢ කි.මී. 960 ක පුද්ගලික ධාවනක දුරක් සහිතව වාහනයක් ලබා දේ
- ➢ අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය ප්‍රතිලාභ

***සෑම අයදුම්කරුවකුම :***

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii. තනතුරට අදාල රාජකාරි නිසිලෙස ඉටු කිරීම හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

තමන් විසින්ම පිළියෙල කරගත් අයදුම්පත්, සියලු ජීව දත්ත, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් හා දුරකථන අංක සමග අදාළ සහතිකවල පිටපත් සහිතව ලියාපදිංචි තැපෑලෙන්, සභාපති ජාතික පශු සම්පත් මණ්ඩලය, අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට, 2023 අප්‍රේල් 17 දිනට පෙර ලැබීමට සැළැස්විය යුතුය. කරුණාකර, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න.

රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතනක ප්‍රධානි මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,**
**අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.**